# සාරාංශය

1998 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ එළි දැක්වුනු විද්‍යාව හා තාක්ෂණවේදය විෂයමාලාව , සැබෑ විද්‍යා දැනුම සමඟ තාක්ෂණයද එක් තැන් වී නිමවූ ගුණාත්මක භාවයෙන් සහ කාලානුරූපී බැවින් ඉහළ වන විෂයමාලාවකි. එබැවින් විෂයමාලාව සඳහා අවශ්‍ය වන භෞතික සම්පත්, මානව සම්පත් හා මූල්‍ය සම්පත් ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව ප්‍රශස්ත මට්ටමින් තිබිය යුතුවේ.. නමුත් විද්‍යාව සහ තාක්ෂණවේදය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආශ්‍රිත සම්පත් පාසල්වල සැබැවින්ම පවතියිද, පවතින සම්පත් පවා කාර්යක්ෂම ලෙස හා ඵලදායි ලෙස භාවිතයේ පවතියිද යන්න ගැටලුවකි.

එබැවින් ශ්‍රී ලංකාවේ පාසල්වල 10-11 ශ්‍රේණිවල විද්‍යාව හා තාක්ෂණවේදය විෂයමාලාව සඳහා සම්පත් කළමනාකරණය පිළිබඳ පර්යේෂණයක නියැලීම පිණිස පාදක කර ගත් ගැටලුව කාලෝචිත බව පර්යේෂකයාගේ අදහස වේ.

පර්යේෂණයේ පළමු අරමුණ වන්නේ විද්‍යාව සහ තාක්ෂණවේදය විෂයයේ ඉගැන්වීම් ක්‍රියාවලියට ප්‍රමාණවත් සම්පත් පාසල්වල පවතිද යන්න විමසීමයි. ශ්‍රී ලංකාව 1AB,1C හා 2 වර්ගයේ පාසල්වල 10-11 ශ්‍රේණි සඳහා විද්‍යාව සහ තාක්ෂණවේදය අනිවාර්ය වුවද පාසල්වල එම විෂයය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා අදාළ භෞතික සම්පත්, මානව සම්පත් හා මූල්‍ය සම්පත් ප්‍රමාණවත් වේද යන්න විමසීම වැදගත් වේ. එමෙන්ම එම සම්පත් කෙතරම් දුරට පාසල්වල විෂය ඉගැන්වීම සඳහා උපයෝගි කොට ගෙන ඇතිද, එනම් සම්පත් සැබැවින්ම කාර්යයක්ම ලෙස හා ඵලදායි ලෙස විෂය ඉගැන්වීම සඳහා යොදා ගෙන ඇතිද යන්න විමසීම දෙවන අරමුණ වේ. මෙම සම්පත් කාර්යක්ෂම ලෙස හා ඵලදායි ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට යොදා ගැනීමේදී ශිෂ්‍යයන්ගේ, ගුරුවරුන්ගේ හා පරිපාලකයින්ගේ කාර්යභාරය නිසි ලෙස ඉටුවන්නේද යන්න විමසීම වැදගත් වේ. මෙම අරමුණු ඔස්සේ දියත් වන පර්යේෂණයේ අවසන් අරමුණ වන්නේ පාසල්වල විද්‍යාව සහ තාක්ෂණවේදය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළ ව සම්පත් කළමනාකරණය ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග විමසීමයි.

පර්යේෂණය සඳහා ගාල්ල දිස්ත්‍රික්කයෙන් පාසල් 15ක නියැදියක් තෝරා ගන්නා ලදී. එම පාසල්වල ශිෂ්‍යයින්, ගුරුවරුන්, පාසල් කළමනාකරණ සහායකයින්, පාසල හා සම්බන්ධ විද්‍යා ගුරු උපදේශකයින් මගින් ලබා ගන්නා දත්ත විස්තරාත්මකව විශ්ලේෂණය සඳහා ප්‍රතිශත, සාමාන්‍යය, ප්‍රස්තාර වගු හා සංඛ්‍යා ලේඛන ආදිය ආශ්‍රයෙන් සැසඳුම් ක්‍රම යොදා ගන්නා ලදී. පර්යේෂණය අවසානයේදී දත්ත විශ්ලේෂණයෙන් අනාවරණය වූ තොරතුරු අනුව නිගමනවලට එළඹීම අවසන් පරිච්ඡේදයෙන් දක්වා ඇත.

10-11 ශ්‍රේණිවල විද්‍යාව හා තාක්ෂණවේදය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආශ්‍රිත සම්පත් පාසල්වල පවතියිද යන්න විමසීමේ දී අනාවරණය වූ පරිදි ප්‍රමාණවත් සම්පත් පවතින්නේ 1AB පාසල්වල පමණි. 1C පාසල්වල තරමක් ප්‍රමාණවත් සම්පත් පැවතුනද 2 වර්ගයේ පාසල්වල සම්පත් අවම මට්ටමක හෝ නොමැති බව පැහැදිලි විය. 2 වර්ගයේ පාසල්වල විද්‍යාව සහ තාක්ෂණවේදය විෂයයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ප්‍රමාණවත් වන අවම භෞතික සම්පත් පවා නොතිබුණි. එමෙන්ම එම පාසල්වල විද්‍යා ගුරු හිඟය, විද්‍යාගාර සහායක, කළමනාකරණ සහායක ඇතුළු මානව සම්පත් හිඟය විශේෂයෙන් දක්නට ලැබේ. එම පාසල්වල පවතින මානව සම්පතෙහි පවා ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මක වශයෙන්ද දුර්වලතා නිරීක්ෂණය විය. 1AB පාසල්වල මූල්‍ය සම්පත සපයා ගැනීමේ අඩුපාඩු දක්නට නොලැබූ අතර 1C හා 2 වර්ගයේ පාසල්වල මූල්‍ය සම්පත් හිඟය තදින්ම බල පවත්වන බව අනාවරණය විය. ජාතික මට්ටමේ සිට පාසල් මට්ටම දක්වා මූල්‍ය සම්පත් වෙන් කිරීමේදී සිදු වන සාධාරණභාවයෙන් තොර ක්‍රියාමාර්ග, මූල්‍ය වෙන් කිරීමේ විෂමතා හා මූල්‍ය කටයුතු සම්බන්ධ අක්‍රමිකතා හේතුවෙන් එම පාසල් වෙත වෙන් කරනු ලබන මූල්‍ය ප්‍රමාණ ප්‍රමාණවත් නොවන බව පැහැදිලි වූ අතර වෙන් කරනු ලැබූ ප්‍රමාණයද පාසල වෙත ළඟා

වීමේදී සිදුවන අක්‍රමිකතා හේතුවෙන් තව දුරටත් අවම වන බව අනාවරණය විය. 1AB පාසල් හා සැසඳීමේදී 1C හා 2 වර්ගයේ පාසල්වලට රජයෙන් හැර වෙනත් සම්පත් සපයා ගැනීමේ විකල්ප මාර්ගද නොමැති බවද පැහැදිලි විය.

එබැවින් සම්පත් කළමනාකරණයේදී එනම් කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස සම්පත් භාවිතයේදී මුහුණදීමට සිදු වන ගැටලු රාශියක් 1C හා 2 වර්ගයේ පාසල්වල දක්නට ලැබුණි.

මනා සම්පත් කළමනාකරණයක් උදෙසා, සම්පත් සපයා ගැනීම හා සම්පත් පරිහරණය කාර්යක්ෂමව හා ඵලදායි ලෙස විද්‍යාව හා තාක්ෂණවේදය විෂයයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදා ගැනීමට නම් පාසල් අතර පවතින මෙම විෂමතාව අවම කළ යුතු වේ. ඒ සඳහා වඩා සාධාරණීය වුත්, විෂමතාවෙන් තොරව විධිමත් ක්‍රියාවලියක් පරිපාලනයේ ඉහළ අමාත්‍යාංශ මට්ටමේ සිට පාසල දක්වා ක්‍රියාත්මක විය යුතු බව පර්යේෂකයාගේ අදහස වේ. අනාගතයේදී අධ්‍යාපන ක්ෂේත්‍රයේ යම් ඵලදායි ප්‍රවර්ධනයක් සඳහා පාසල් පරිශ්‍රය ඇසුරින් සත්‍ය ලෙස සිදු කරන ලද මෙම පර්යේෂණය තුළින් අනාවරණය වු තොරතුරු අනුව ලත් නිගමන හා යෝජනා පදනම් කර ගැනීම යෝග්‍ය බව පර්යේෂකයාගේ අදහස වේ.